# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මාතෘ ප්‍රතිලාභ (සංශෝධන)

**(140 වන අධිකාරය වූ) මාතෘ ප්‍රතිලාභ ආඥාපනත සංශෝධනය**
**කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනී ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
විසින් 2024 අගෝස්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 ජූලි මස 31 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[290 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**මාතෘ ප්‍රතිලාභ (සංශෝධන)**

**(140 වන අධිකාරය වූ) මාතෘ ප්‍රතිලාභ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක      දරන මාතෘ ප්‍රතිලාභ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** මාතෘ ප්‍රතිලාභ ආඥාපනතේ (මෙතැන් සිට "ප්‍රධාන පනත" ලෙස හැඳින්වෙන) 3 වන වගන්තිය, එම වගන්තියේ (1) (ඇ) සහ (1) (ඈ) උපවගන්ති ඇතුළත් කිරීම මගින් පහත පරිදි සංශෝධනය කෙරේ:-

" (ඇ) ගබ්සාව සිදු වූ දින සිට දින හතක්, ගැබ්ගැනීමෙන් පළමු සති විසි අට තුළ ගබ්සාව සිදු වුවහොත්; සහ

(ඈ) කිසියම් වෛද්‍යමය හේතුවක් මත ගැබ් ගැනීම අවසන් වුවහොත් සහ එසේ සිදු වූ දින සිට දින හතක්.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.